# සමෘද්ධි බැංකු සංගම්හි ණය කටයුතු සම්බන්ධ ක්‍රියාවලිය

## රටවිරුවෝ නිවාස ණය යෝජනා වැඩසටහන

**බැංකු මුල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට විසිඑක්වන එකතුව**

1. සභාපති, පාලක මණ්ඩලය,
   සමෘද්ධි බැංකු සංගමය, ..............................
2. කළමනාකරු, 11.සාමාන්‍යාධිකාරි සහ සියළුම අධ්‍යක්ෂවරු,
   සමෘද්ධි බැංකු සංගමය, ..............................
3. සභාපති, විධායක කමිටුව,
   සමෘද්ධි මහ සංගමය, ..............................
4. කළමනාකාර අධ්‍යක්ෂ,
   සමෘද්ධි මහ සංගමය, ......................................
5. මුලස්ථාන කළමනාකරු,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ..............................
6. ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ......................................
7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ......................................
8. දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරි,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ......................................
9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ......................................
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

12. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
    5 වන මහල, අංක 464, ටී.බී. ජායා මාවත,
    කොළඹ 10.
13. සහකාර අධ්‍යක්ෂ නීති
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

බැංකු මුල්‍ය කටයුතු අංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

2013.11.07

දුරකථන අංකය :- 0112 - 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.11.07

# රටවිරුවෝ නිවාස ණය වැඩසටහන

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට විසිඑක්වන එකතුව**

**1. හැඳින්වීම.**

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ හා විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගේ උපදෙස් හා මග පෙන්වීම් මත ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක්ව ක්‍රියාත්මක කරනු ලබන "රටවිරුවෝ විශේෂ ණය වැඩසටහන" යටතේ සමෘද්ධිප්‍රතිලාභීන්, අඩු අදායම්ලාභීන් හා දිවිනැගුම වැඩසටහන සම්බන්ධිත පවුල් වල විදේශ ගත වන ස්ථිර නිවසක් නොමැති ශ්‍රමිකයන් සඳහා නිවසක් ඉදිකරගැනීම, දැනට නිම කර ඇති නිවසකට අළුතින් කොටසක් එක්කිරීම හෝ දැනට නිම කර ඇති නිවසට නවීකරණ කටයුතු සඳහා සමෘද්ධි බැංකු සංගම් මගින් රු.ලක්ෂ 3 ක මුදලක් 10% ක පොලී ප්‍රතිශතයක් යටතේ ලබාදීමට කටයුතු කරනු ඇත.

**2. අරමුණු.**

රට විරුවෝ නිවාස ණය වැඩසටහන යටතේ දැනට නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට 16 ,17 හා 19 වන එකතුන් වල සඳහන් උපදෙස් හා මග පෙන්වීම් වල සිදුකළ යුතු විශේෂ සංශෝධන හා ඒ මගින් ආවරණය නොවන්නා වූ කරුණු පැහැදිළි කිරීමක් සඳහා මෙම සංශෝධන නිකුත් කරනු ඇත.

3. **නිවාස වැඩසටහන ක්‍රියාත්මක වන අකාරය.**

3.1 "නිවාස ණය වැඩසටහන" යටතේ සුදුසුකම් ලබන ප්‍රතිලාභීන්.

මෙම ණය වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන්, අඩු ආදායම්ලබන්නන් හා දිවිනැගුම ජාතික වැඩසටහනේ ප්‍රතිලාභ ලබන පවුල් වල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ත කාර්යාංශය යටතේ ලියාපදිංචිය ඇතිව ඕනෑම රටක රැකියා කිරීම සඳහා ප්‍රථමවරට විදේශගතවන ශ්‍රමිකයන්, දැනට විදේශගත වී ඇති (වසර දෙකකට ව අඩුකාලයක් තුළ) ඇති ශ්‍රමිකයන් විදේශ ගත වී ආපසු ලංකාවට පැමිණ (වසරකට අඩු කාලයක් තුළ) ශ්‍රමිකයන් සුදුසුකම් ලබනු ඇත.

3.2 ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්නායකයන්.

රටවිරු නිවාස ණය වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා පහත සඳහන් නිර්නායකයන් සපුරා තිබිය යුතුය.

1. නිවසක් ඉදිකරගැනීමේ අවශ්‍යතාවය හා ණය මුදලක් ලබාගැනීමට කැමත්ත ප්‍රකාශ කිරීමේ ලිපියක් ඉදිරිපත් කිරීම.

2. නිවසක් ඉදිකරගැනීම සඳහා ප්‍රමාණවත් ඉඩම් කොටසක් තිබිය යුතුය. (එය ප්‍රාදේශීය සභාව, නගර සභාව හෝ මහ නගර සභාව අනුමත කරනු ලබන පර්චස් ප්‍රමාණයක් තිබිය යුතුය.)

3. ණය ලබාගන්නා ප්‍රතිලාභියා අනිවාර්යයෙන්ම විදේශගත විය යුතුය. (එය පළමු වරට විදේශගත වන අය සඳහා පමණක් බලපානු ඇත.

4. ණය ලබාගැනීම සඳහා අයදුම් කරන ප්‍රතිලාභීන් ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය හඳුන්වා දී ඇති ආකෘතියට අනුව අයදුම්පතක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දිස්ත්‍රික් කාර්යාලයේ කළමනාකරු මගින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සහාකර සමෘද්ධි කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

   එම අයදුම්පත සමග පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

   - විදේශගත වන/ විදේශගත වී ඇති ශ්‍රමිකයන් විසින් ඒ සඳහා සකස් කර ඇති ප්‍රකාශ පත්‍රය පුරවා සකස් කර එහි මුල් පිටපත ඉදිරිපත් කිරීම. (ඇමුණුම 01)
   - දැනට භාවිතා කරන ගමන් බලපත්‍රයේ ඡායාරූප සහිත කොටස/ වීසා පිටුවල සහතික කළ ඡායා පිටපතක්.
   - විවාහ වී ඇත්නම් විවාහ සහතිකයේ ඡායාපිටපතක්.
   - පත්කරනු ලබන නියෝජිතයාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපතක්.
   - විදේශගත වන ශ්‍රමිකයාගේ කලත්‍රයා හෝ නිවස සෑදීම සඳහා භාර ගන්නා තැනැත්තාගෙන් දිවුරුම් කොමසාරිස්වරයකු සහතික කළ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

3.3 අයදුම්පත් පරීක්ෂා කිරීම හා තෝරාගැනීම.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ලැබෙන අයදුම්පත් ලේඛනගත කිරීමෙන් අනතුරුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වර්ගීකරණය කර අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි බැංකු සංගම් ණය කළමනාකරු, සමාජ සංවර්ධන සහාකර හෝ වසමභාර සමෘද්ධි සංවර්ධන නිලධාරී වෙත භාර දී නිවාස ණය නිකුත් කිරීම සඳහා වූ සුදුසුකම් ඇති බවට තහවුරුවක් ලබාගෙන දිස්ත්‍රික් කාර්යාලය වෙත වාර්තා කළ යුතුය. අයදුම්පත ප්‍රතික්ෂේප කරන්නේ නම් ඒ බව සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපියක් ප්‍රතිලාභියාගෙන් ලබාගත යුතුය. තෝරාගත් ප්‍රතිලාභීන් වෙත ණය නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරගැනීම සඳහා කලාප බැංකු සංගම් කළමනාකරුවන් කටයුතු කළ යුතුය. (සමෘද්ධි බැංකු සංගම් ණය නිදහස් කිරීමේ ක්‍රියාවළිය අනුව කටයුතු කළ යුතුය.)

## 04. ණය මුදල් නිදහස් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු.

4.1 ඉදිකරනු ලබන නිවාස සැලැස්ම.

මෙහෙයුම් උපදෙස් අංක 4 ට 16 වන එකතුවේ 8 ඡේදයේ 8.2 ප්‍රකාරව ඉදිරිපත් කර ඇති සැලසුම අනුව අවශ්‍ය නිවස තෝරාගත හැකිය. එහිදී නව නිවසක් ඉදිකිරීම සඳහා යන කොන්දේසිය ලිහිල් කර දැනට ඉදිකර ඇති නිවසට කොටසක් එකතු කිරීම, නිවසක ඉතිරි වැඩ කොටස සම්පූර්ණ කරගැනීම සඳහා ද ණය මුදල නිදහස් කළහැක.

4.2 මූලික තැන්පත් මුදලක් ලබාගැනීම.

මෙහෙයුම් උපදෙස් අංක 4 ට 16 වන එකතුවේ 8 ඡේදයේ 8.4 වගන්තිය අවලංගු කරනු ලබන අතර, ප්‍රතිලාභියා විසින් මූලික තැන්පතුවක් අවශ්‍ය නොවනු ඇත.

4.3 විදේශගත වන ශ්‍රමිකයාගේ බලය පැවරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන.

1. මෙහෙයුම් උපදෙස් අංක 4 ට 19 වන එකතුවේ 8 ඡේදයේ සඳහා යෝජනා කර ඇති ඇටෝර්නි බලය දැනටමත් ලබාගෙන ඇත්නම් එය ඉදිරියටත් වලංගු වන අතර, ඉදිරියට ද එම ඇටෝර්නි බලය වෙනුවට මේ සමඟ අමුණා අති ප්‍රකාශ පත්‍රයක් සකස් කර සමෘද්ධි බැංකුවේ ණය නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කළයුතුය.
2. විදේශගත වී ඇති හෝ විදේශගත වන ශ්‍රමිකයන් විසින් දේශීය වශයෙන් බලය පැවරෙන තැනැත්තාට අදාල ණය මුදල ලබාගැනීම, ගොඩනැගිල්ල ඉදිකිරීමට ලබාගන්නා ණය මුදල සම්බන්ධ වගකීම් පැවරෙන බවත්, සඳහන් කරමින් දිවුරුම් කොමසාරිස්වරයකුගේ දිවුරුම් ප්‍රකාශය ලබාගෙන ඉදිරිපත් කළ යු තුය.


4.4 ණය මුදල නිදහස් කිරීමේ දී ලබාගත යුතු බැඳුම්කරයන් රටවිරු නිවාස ණය වැඩසටහන යටතේ විදේශගත වූ ශ්‍රමිකයින්ට හා විදේශගත වීමට බලාපොරොත්තු වන ශ්‍රමිකයින් වෙත ණය මුදල නිදහස් කිරීමෙන් අනතුරුව ඉඩම් ඔප්පුව උකස් කරයක් ලෙස සමෘද්ධි බැංකුව භාරයට ගැනීම අවශ්‍ය නොවනු ඇත. එහිදී දැනට නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් අංක 4 ට 16 වන එකතුවේ 7 ඡේදයේ 7.4,7.5,7.6 යටතේ සඳහන් කර ඇති ලිපි ලේඛන ලබාගැනීමට අවශ්‍ය නොවන අතර, එම ඡේදය අවලංගු වනු ඇත.


4.5 ණය වාරික ආපසු අයකරගැනීම.

ණය මුදල අනුමත කරන රටවිරුවන් වෙනුවෙන් ණය වාරික ආපසු අය කිරීම සඳහා අදාල ශ්‍රමිකයා විසින් රාජ්‍ය වානිජ බැංකුවක හෝ පෞද්ගලික බැංකු ශාඛාවක (NRFC) ගිණුමක් ආරම්භ කර නොමැති නම් එම ශ්‍රමිකයා ලංකාවට මුදල් එවීම සඳහා භාවිතා කරනු ලබන, ඉතිරි කිරීම් ගිණුමේ වුවද, ණය වාරික අයකරගැනීමට යොදාගැනීම ප්‍රමාණවත් වනු ඇත. ඒ සඳහා බැංකුව වෙත බලය පැවරීම සඳහා ආකෘතිපත්‍ර 03 භාවිතා කළ යුතුය.

4.6 නිවස ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම.

නිවස ඉදිකිරීම සඳහා අවශ්‍ය කොටසක් ඉදිකරීම හෝ අළුත්වැඩියා කටයුතු සඳහා ද මෙම ණය මුදල් ලබාගත හැකි බැවින්, ඒ සඳහා මෙහෙයුම් උපදෙස් අංක 4 ට 17 වන එකතුවේ 2 ඡේදයේ 2.1 සඳහන් පරිදි රජයේ පිළිගත් කාර්මික නිලධාරියකුගෙන් ඇස්තමේන්තුවක් සකස් කරගැනීම යන කොන්දේසිය අහෝසිකර ඒ සඳහා රජයේ පිළිගත් ඉදකිරීම් කටයුතු වල නියුතු නිලධාරියකු සකස් කළ ඇස්තමේනතුවක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වනු ඇත.





ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,
නි. අධ්‍යක්ෂ - බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම්.

# ප්‍රකාශන පත්‍රය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ....................................දිස්ත්‍රික්කයේ ............................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................................................................................... ලිපිනයෙහි පදිංචි .......................................................................... වන මම පහත ප්‍රකාශය කරමි.

ඉහත නම සඳහන් මාගේ ජාතික හැඳුනුම්පත් අංකය ............................................. වන අතර මාගේ විදේශ ගමන් බලපත්‍ර අංකය .................................. වේ.

මා දැනට .................................................. රටෙහි ................................................................ රැකියාව සඳහා ................................ දින සිට පැමිණ සේවය කරමි. ඉහත ගමන් බලපත්‍ර අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය මා වෙනුවෙන් නිකුත් කරන ලද්දකි.

මා විසින් විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය එක්ව ආරම්භ කර ඇති රට විරු "පියස" නිවාස යෝජනා ක්‍රමය යටතේ ණය මුදලක් සත්‍ය වශයෙන්ම ඉල්ලුම් කර ඇති අතර, එම ණය මුදල භාරගැනීම සඳහා මාගේ ........................................................................................ වන ............................................... වෙත ලබාදීමටත්, එම කර්තව්‍ය සඳහා ඔහු/ ඇය යොමු කිරීමට මාගේ කැමැත්ත ප්‍රකාශ කරමි.

එකී ණය මුදලට අදාලව ගෙවීම් කිරීමේදී මාවිසින් නියමිත වාරික නිසි පරිදි ගෙවීම් කරන බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

නම .................................................. අත්සන .................................. දිනය ...........................

ඇමුණුම - 03

……………………………………………

……………………………………………

……………………………………………

20……………………………………

කළමනාකරු,

……………………………………………

……………………………………………

……………………………………………

**<u>අංක ……………………………… දරණ NFRC බැංකු ගිණුම/ ඉතිරි කිරීමේ ගිණුමෙන් ………………… සමෘද්ධි බැංකුව වෙත මුදල් යැවීම සඳහා බලය පැවරීම.</u>**

…………………………………… ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ………………………………………………………………………………… ලිපිනයේ පදිංචි ……………………………………………………………………… වන මා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ……………………………… සමෘද්ධි බැංකු සංගමයේ රටවිරු නිවාස ණය වැඩසටහන යටතේ ණය මුදලක් ලබාගෙන ඇති බැවින්, ඒ සඳහා ගෙවිය යුතු ණය වාරිකය ලෙස ඔබ බැංකු ශාඛාවේ අංක …………………………………… දරණ ගිණුම රු.……………………/- ක මුදලක් 20……………………… මස සිට …………………………………… සමෘද්ධි බැංකුවේ නමින් ලංකා බැංකුව/ මහජන බැංකුව ……………………… ශාඛාවේ ගිණුමට යැවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

……………………………………………

ප්‍රතිලාභියාගේ අත්සන.